එච්.අයි.වී/ඒඩ්ස්, ආසාදිතයින් හෝ රෝගීන් පිළිබඳව වාර්තා කිරීමේදී මාධ්‍ය මඟින් පිළිපැදීම යෝග්‍ය යැයි නිර්දේශිත ආචාර ධර්මයන් තිබේ. එච්.අයි.වී/ඒඩ්ස් සම්බන්ධයෙන් අදාළ වන සංවේදී කරුණු මනා විවෘතභාවයකින් සහ ගරුත්වයකින් යුතුව සාකච්ඡා කිරීමත්, විශේෂයෙන්ම එච්.අයි.වී/ඒඩ්ස් ආසාදිතයින් හා රෝගීන්ව කොන් කිරීමකට, ගර්හාවකට හෝ අගතියකට ලක් වන ආකාරයේ වාර්තාකරණයන් හි නොයෙදීමත් එම ආචාර ධර්මයන් අතර වේ.

දෙසැම්බර් 01, ලෝක ඒඩ්ස් දිනය දා ලංකාදීප ඔන්ලයින් හි (12/01) පළවූ "තෙවන සිල්පදය කඩා ලෙඩ වුවත් වැඩිවෙයි" යන සිරස්තලය, මෙම ආචාර ධර්මයන් මාධ්‍ය අතින් උල්ලංඝනය වන අවස්ථාවකට උදාහරණයක් ලෙස දැක්විය හැක.

1) එච්.අයි.වී වෛරසය සෑමවිටම ලිංගිකව පමණක් සම්ප්‍රේෂණය නොවේ. එච්.අයි.වී වැළඳිය හැකි වෙනත් හැකියාවන්ද තිබේ. එසේ නම්, ලිංගික හැසිරීම් ඔස්සේ පමණක් එච්.අයි.වී වැළඳෙන බවට ඉඟි කරනා මෙවැනි සිරස්තලයක් ඔස්සේ නිරවද්‍ය නොවන තොරතුරු සමාජගත වෙතැයි ඔබ නොසිතන්නේ ද?

2) තෙවන සිල්පදය හෙවත් "කාමයේ වරදවා හැසිරීම" ඔස්සේ එච්.අයි.වී වැළඳෙන බවට වන මෙවැනි සිරස්තල ඔස්සේ, එච්.අයි.වී/ඒඩ්ස් ආසාදිතයින් හා රෝගීන් සම්බන්ධයෙන් සමාජය තුළ ගර්හාත්මක, කොන් කිරීමේ ආකල්පයක් ප්‍රවර්ධනය නොකෙරෙන්නේ ද?

මෙම සිරස්තලය පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

මූලාශ්‍ර:
https://www.hivmediaguide.org.au/.../principle.../index.html
https://www.presscouncil.nic.in/.../guidelines%20on...